# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. SASA/2022/A/53 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2022.07.08 |

අතිගරු ජනාධිපතිතුමා,
ජනාධිපති මන්දිරය,
කොළඹ 01.

ගරු අග්‍රාමාත්‍යතුමා,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

**<u>පවත්නා සමාජ, ආර්ථික හා දේශපාලනික අර්බුදය නිමා කිරීම සඳහා සක්‍රියව මැදිහත්වීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම</u>**

මෙරට රාජ්‍ය සේවය තුළ ප්‍රමුඛතම කොටස්කරුවකු වන ශ්‍රී ලංකා පරිපාලන සේවය නියෝජනය කරන අප සංගමය මෙවන් ආමන්ත්‍රණයක් ඔබ වෙත කිරීමට සිදුවීම පිළිබඳව ඉමහත් කනගාටුවට පත් වෙමු.

ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිදිනෙක නොවූ විරූ ආකාරයේ ආර්ථික , සමාජයීය හා දේශපාලනික කඩාවැටීමකට ලක් වීම කෙරෙහි, දේශපාලන නායකත්වය ප්‍රමුඛව ද, රාජ්‍ය සේවය හා සිවිල් සමාජය ද අඩුවැඩි වශයෙන් වගකිවයුතු යැයි අපි විශ්වාස කරමු. කෙසේ නමුත් මේ සඳහා මූලිකව වගකිව යුත්තේ මෙතෙක් රාජ්‍ය පාලනය කළ හා එයට හවුල් වූ දේශපාලනික ක්‍රියාකාරීන් බවට වන සමාජ මතය හා අපගේ මතය ද සමපාත වන බව පෙන්වා දිය යුතු ය.

සිය දේශපාලන බලය තහවුරු කරගැනීම සඳහා;

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවභාවිත කිරීම.
- නීතියේ ආධිපත්‍යයට ගරු නොකිරීම.
- ස්ථාවර ජාතික ප්‍රතිපත්ති වලින් තොරව රට මෙහෙයවීම.
- රාජ්‍ය ආදායම් හා වියදම් විධිමත් පරිදි කළමනාකරණය නොකිරීම.
- සංවර්ධන ප්‍රමුඛතා හඳුනා නොගෙන ප්‍රාග්ධන වියදම් දැරීම.
- යහපාලන මූලධර්මයන්ට පටහැනිව කටයුතු කිරීම.
- දූෂණ හා වංචාවන් හි යෙදීම සඳහා අනුගාමිකයන්ට ඉඩකඩ සැලසීම.
- රාජ්‍ය සේවය දේශපාලනීකරණයට ලක්කිරීම හා ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම නිර්මාණය නොකිරීම.
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වල තනතුරු වලට දේශපාලන බලපෑම් මත නිලධාරීන් පත් කිරීම
- ප්‍රායෝගික බුද්ධිමතුන්ට ව්‍යවස්ථාදායකයට පිවිසීමට ඇති සාධාරණ අවස්ථා අවුරා තබන අධික වියදම් සහිත මැතිවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන නියෝජිතයන් නඩත්තු කිරීම සඳහා අති විශාල වියදමක් දැරීම.
- නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය නොකර සේවා අංශ කෙරෙහි වැඩි නැඹුරුතාවකින් යුක්තව කටයුතු කිරීම.

රට මෙවන් අගාධයක් වෙත යොමු කිරීමට හේතු වූ මූලික කරුණු බව අපගේ විශ්වාසයයි.

මෙම තත්ත්වයට එරෙහි ව, ප්‍රබල මහජන මතයක් ගොඩනැගී ඇති වටපිටාවක් තුළ වුව ද තත්කාලීනව රජයේ වගකීම දරන ඔබ දෙපල ප්‍රමුඛ දේශපාලනඥයින්ගේ වගකීම් විරහිත ක්‍රියාකලාපයත්, ඇතැම් දේශපාලනඥයින් බලය ලබා ගැනීමට හා බලය තහවුරු කර ගැනීමට දරන ජුගුප්සාජනක හැසිරීමත්, ව්‍යවස්ථාදායකය කෙරෙහි වූ මහජන පිළිගැනීම මුළුමනින් ම බිඳවැටීමට හේතු වූ බව පෙන්වා දිය යුතු ය.

මෙම අසීරු මොහොතේ ඇතැම් දේශපාලනඥයින් සිය සුඛ විහරණය සඳහා රාජ්‍ය දේපල අවභාවිත කිරීම, වංචනික හා දූෂිත ගනුදෙනුවලට පෙළඹීම හා දූෂිත නිලධාරීන් උසස් තනතුරුවලට පත් කිරීම පවතින අවාසනාවන්ත තත්ත්වය තවදුරටත් තීව්‍ර කරයි. එසේම, අප සංගමය විසින් රාජ්‍ය යන්ත්‍රණය යලි ගොඩනංවාලීම සඳහා වෙහෙසකර ප්‍රයත්නයකින් අනතුරුව ඔබ දෙපල ප්‍රමුඛ සියලුම දේශපාලන පක්ෂවලට ඉදිරිපත් කරන ලද කෙටිකාලීන යෝජනාවලියේ අඩංගු කරුණු කෙරෙහි, කිසිදු අවධානයක් නොදක්වා සාම්ප්‍රදායික ක්‍රමවේද ඔස්සේ රට මෙහෙයවීම ද කනගාටුවට කරුණකි. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර බල තුලනයක් ඇති කිරීම, රාජ්‍ය සේවය ස්වාධීන කිරීම, ස්ථාවර ජාතික ප්‍රතිපත්ති රාමුවක් පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපත්ති සභාවක් ස්ථාපිත කිරීම, ඇතුළු ප්‍රධාන කරුණු 11ක් ඔස්සේ දහනම වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සාධනීය අංග ඇතුළත් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ යෝජනා කිසිවක් කෙරෙහි නිසි සැලකිල්ලක් නොදැක්වීම මෙයට උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

මැතිවරණයක් පැවැත්වීමට සුදුසු වාතාවරණයක් එළඹෙන තෙක්, කෙටි කාලයක් සඳහා ජාතික හා ජාත්‍යන්තරව පිළිගත හැකි ආකාරයේ සර්ව පාක්ෂික රජයක් පිහිටුවා ගන්නා ලෙස අප සංගමය ද ඇතුළුව ආගමික නායකත්වය ප්‍රමුඛ මෙරට විද්වතුන්, සිවිල් සංවිධාන විසින් ඉදිරිපත් කර ඇති යෝජනා නොසලකා හරිමින් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අරාජික තත්ත්වයක් රට තුළ නිර්මාණය වෙමින් පවතී. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග මාණ්ඩලික නිලධාරී මට්ටමේ එකඟතාවකට එළඹීම ප්‍රමාද වීම කෙරෙහි රජය ස්ථාවර නොවීම, පොදු එකඟතාවයකින් කටයුතු නොකිරීම හා අන්තර්ජාතික ප්‍රජාවගේ ගෞරවාන්විත පිළිගැනීම ලබා ගැනීමට අපොහොසත් වීම හේතු වූ බව නිරීක්ෂණය වේ. ඒ අනුව තවදුරටත් වර්ධනය වන ආර්ථික අර්බුදය, රාජ්‍ය සේවය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය කිරීමට සමත් වන බව වහා දේශපාලන නායකත්වය තේරුම් ගත යුතු ය.

ඒ අනුව වාස්තවික තත්ත්වයන් සැළකිල්ලට ගෙන ජාතික හා ජාත්‍යන්තරව පිළිගත හැකි රජයක් සමග ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කරමින් අල්ලස, දූෂණය හා වංචාව පිටුදකින ස්ථිරසාර ක්‍රමවේදයක් ඔස්සේ රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවීම සඳහා වන වැඩපිළිවෙලකට පමණක් ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සහය ලබා දෙන බව මෙයින් දන්වා සිටිමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්

පිටපත්:

1. ගරු කතානායකතුමා
2. සියලුම අමාත්‍යවරුන්
3. සියලුම දේශපාලන පක්ෂ නායකවරුන්
4. සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන්
5. සියලුම වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන